




මුරලි

ශ්‍රී ලංකා - එංගලන්ත ටෙස්ට් තරගාවලියේ වීරයා

## මුරලිගේ වාර්තා පොතෙන්

**ටෙස්ට්**

| | |
|---|---|
| තරග | 106 |
| පන්දු | 35161 |
| ලකුණු | 14035 |
| කඩුලු | 635 |
| ඉනිමක හොඳම පන්දු යැවීම | 9/51 |
| තරගයක හොඳම පන්දු යැවීම | 6/220 |
| සාමාන්‍යය | 22.10 |

**එක් දින ජාත්‍යන්තර තරග**

| | |
|---|---|
| තරග | 273 |
| පන්දු | 14949 |
| ලකුණු | 9587 |
| කඩුලු | 414 |
| ඉනිමක හොඳම පන්දු යැවීම | 7/30 |
| සාමාන්‍යය | 23.15 |

## ශ්‍රී ලංකා - එංගලන්ත ඉදිරි තරග

**June 2006**

**Thu 15**
Only Twenty20 International - England v Sri Lanka
The Rose Bowl, Southampton

**Sat 17**
1st ODI - England v Sri Lanka - Lord's, London

**Tue 20**
2nd ODI - England v Sri Lanka
Kennington Oval, London

**Sat 24**
3rd ODI - England v Sri Lanka
Riverside Ground, Chester-le-Street

**Wed 28**
4th ODI - England v Sri Lanka - Manchester

**July 2006**

**Sat 1**
5th ODI - England v Sri Lanka - Headingley, Leeds

**Tue 4**
1st ODI - Sri Lanka v Netherlands - Amstelveen

**Thu 6**
2nd ODI - Sri Lanka v Netherlands - Amstelveen

## විස්තර විචාරකයාට චෝදනා

ශ්‍රී ලංකා කණ්ඩායමේ එංගලන්ත තරග සංචාරය රූපවාහිනියෙන් සජීවීව විකාශය නොවුවත් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඔස්සේ සජීවීව එම විස්තර විකාශය කෙරෙයි. එසේ වුව ද එංගලන්තයේ සිට සජීවී තරග විකාශයට එක්ව සිටින ක්‍රිකට් තරග විස්තර විචාරකයෙකු ද වන ගුවන් විදුලි සංස්ථාවේ ක්‍රීඩා අංශයේ නිලධාරියකුට එරෙහිව බරපතල මුදල් වංචා චෝදනාවක් එල්ල වී තිබේ.

ගුවන් විදුලි සංස්ථාවේ සභාපති සුනිල් සරත් පෙරේරා මහතාගේ අත්සන ව්‍යාජ ලෙස යොදා ගනිමින් මෙම ක්‍රිකට් තරග විකාශය සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් රුපියල් ලක්ෂ 25ක අනුග්‍රාහක මුදලක් ලබාගත් බවට මෙහිදී මේ නිලධාරියාට එරෙහිව එල්ල වී ඇති චෝදනාවය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රිකට් තරග විකාශයක් සඳහා දේශීය විද්‍යුත් මාධ්‍යයකට අනුග්‍රාහක මුදලක් ලබාදුන් ප්‍රථම අවස්ථාව මෙය වේ. රූපවාහිනී සජීවී විකාශයද සිදු නොවන බැවින් මේ සඳහා ක්‍රිකට් අතුරු කමිටුවේ සභාපති ජයන්ත ධර්මදාස මහතාගේ අනුමැතිය ලැබුණු බවද සඳහන් වේ. ■

## ලෝක කුසලාන පාපන්දු තරගාවලිය ඇරඹෙයි



තනි ක්‍රීඩාවක් වෙනුවෙන් පවත්වනු ලබන ලොව ජනප්‍රියම හා විශිෂ්ටතම ක්‍රීඩා තරගාවලිය වන ලෝක කුසලාන පාපන්දු තරගාවලිය ජුනි 9දා ජර්මනියේදී විචිත්‍රවත් සමාරම්භක උළෙලක් ආරම්භ කෙරිණ. මෙම, ලොව අසිරිමත් ක්‍රීඩා සැණකෙළියට රටවල් 32 ක් සහභාගි වන අතර තරග 64 ක් පැවැත්වේ. අයිවරි කෝස්ට්, ඝානා, සර්බියා හා මොන්ටෙනෙග්‍රෝ, ටෝගෝ, ට්‍රිනිඩෑඩ්, ටුබැගෝ හා යුක්රේනය ප්‍රථම වරට ලෝක කුසලාන පාපන්දු අවසන් තරගාවලියකට මුහුණ දෙති.

අවසන් වරට පැවැති 2002 තරගාවලියද ඇතුළුව පස් වතාවක් ලෝක ශූරතාව දිනා සිටින බ්‍රසීල පිල මෙවරත් ශූරතාව දිනා ගනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. රොනල්ඩෝ, රොනල්ඩිනෝ ඇතුළු සුපිරි තරු පිරිවරා ගත් බ්‍රසීල පිල සහභාගි වන ප්‍රථම තරගය 13දා පැවැත්වේ.




